ගැණුම් මිලෙන් 75%ක වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කුරුණෑගල දිසා අධිකරණයේ ඉහත ඇස්කීසි අංක දරන නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-*
කළමණාකරු :- සෙලාන් බැන්ක්, ගම්පහ ශාඛාව.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, කුරුණෑගල.

04-504

---

# විවිධ දැන්වීම්

## 20 කියුබ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

### කොටසින් සීමිත සමාගම - සමාගම් ලියාපදිංචි අංකය PV91249

### වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ අධිකරණය විසින් සමාගමක් ගණින් බේරා වසා දැමීම

කොළඹ 03, ගාලු පාර, අංක 464 2/1 හි 20 කියුබ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත් මහාධිකරණය වෙත වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 31 වන දින ඉහත නම් සඳහන් ඒෂියන් මෙට්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණින් බේරා වසා දැමීමට පෙත්සමක් ඉදිරිපත් කර ඇති බැව් මෙසේ දැනුම් දෙනු ලැබේ. තවද, එකී පෙත්සම වර්ෂ 2019 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින අධිකරණය හමුවේ විභාගයට ගැනීමට නියම කර තිබේ. එකී පෙත්සම සම්බන්ධයෙන් නියෝගයක් කිරීම ගැන විරෝධය දක්වන්නා වූ හෝ එකඟතාවය දක්වන්නා වූ කවර හෝ ණය හිමියකු හෝ එකී සමාගමට දායක වූ අයකු ඇතොත් මෙම පෙත්සම විභාග කරන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ අධිනීතිඥවරයෙක් හෝ නීතිඥවරයෙකු මගින් එම කටයුත්ත සඳහා පෙනී සිටිය හැක. එකී පෙත්සමේ පිටපතක් කවර හෝ ණය හිමියෙකුට හෝ එකී සමාගමට දායක වූ අයට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු පහත සඳහන් අය විසින් එම පිටපත් සපයනු ලැබේ.

වාර්නස්,
නීතිඥවරු,
14 වන මහල, බටහිර කුළුන,
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එචිලන් චතුරශ්‍රය,
කොළඹ 01.

*සැලකිය යුතුයි.-*

එකී පෙත්සම විභාග කරනු ලබන අවස්ථාවේ දී පෙනී සිටීමට අදහස් කරනු ලබන කිසියම් තැනැත්තෙකු ඇතොත් ඔහු තම අභිලාශය ලිඛිතව නොතීසියක් මගින් ඉහත නම් වාර්නස් නීතිඥ සමාගම වෙත භාරදිය යුතුය. නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එකී නොතීසියෙහි එකී තැනැත්තාගේ හෝ සමාගමක් නම් සමාගමේ නම සහ ලිපිනය සඳහන් කර එම පුද්ගලයා හෝ සමාගම හෝ ඔහු හෝ ඔහුගේ නීතිඥ විසින් අත්සන් කර භාරදිය යුතුය. *නැතහොත්* තැපැල් කරන්නේ නම් 2019 ක් වූ අප්‍රේල් මස 03 වැනි දින පස්වරු 6.00 පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි කල්වේලා ඇතිව තැපැල් කළ යුතුය.

20 කියුබ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පෙත්සම්කරු.

වර්ෂ 2019 ක් වූ මාර්තු මස 19 වැනි දින දී ය.

04-66

